**වලල්ලාවිට ප්‍රාදේශීය සභාව**

**------------------------------**

**කළුතර දිස්ත්‍රික්කය**

**------------------**

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 අගෝස්තු 18 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

| | විගණන නිරීක්ෂණය<br>----------------------- | නිර්දේශය<br>------------ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම<br>---------------------- |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.2,952,925 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | අඩු ආදායම්ලාභි සභාවක් බැවින් මෙතෙක් ප්‍රතිපාදන සලසා නොමැත. |
| (ii) | පෙර වර්ෂ වල මුද්දර ගාස්තු වෙනුවෙන් ලැබී තිබූ රු.4,608,010 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | 2020 අවසන් ගිණුම මගින් නිවැරදි කිරිමට කටයුතු කරන බව දන්වමි. |
| (iii) | වර්ෂ අවසාන තොග වටිනාකම ලෙස භෞතික තොගය ගිණුම්ගත කිරීම වෙනුවට රු.4,001,388 ක්වූ පොත් අගය ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | 2020 අවසන් ගිණුම මගින් නිවැරදි කිරිමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.65,537 ක් වටිනා ජල ටැංකි තුනක් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | 2020 අවසන් ගිණුම මගින් නිවැරදි කිරිමට කටයුතු කරන බව දන්වමි. |
| (v) | සමාලෝචිත වර්ෂයේ ඉදි කරන ලද රු.676,102 ක් වූ ජල ටැංකියක් හා රු.64,771 ක් වූ ආදාහනාගාරයේ වැට ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | 2020 අවසන් ගිණුම මගින් නිවැරදි කිරිමට කටයුතු කරන බව දන්වමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන් දිමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.29,336,629 ක් වූ ගිණුම් විෂයයන් 10 කට අදාළ ශේෂයන් හා ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.6,759,602 ක වෙනසක් විය. | අදාල ශේෂ වල වෙනස් කම් සසඳා ගිණුම් නිවැරදි කිරිමට කටයුතු කල යුතුය. | උපලේඛන සකස් කිරිමේදී වැරදි සිදු වී ඇත. 2020 අවසන් ගිණුම මගින් නිවැරදි කරන බව දන්වමි. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ 02 ක කාලයක් ඉක්ම වූ කර්මාන්ත ණයගැති රු.730,688 ක් හා රු.960,789 ක් වූ ණයහිමි ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කල යුතුය. | 2020 අවසන් ගිණුම මගින් නිවැරදි කිරිමට කටයුතු කරන බව දන්වමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය හා වාහන සමීක්ෂණ වාර්තා නොමැති වීම නිසා එකතුව රු.28,155,109 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුය. | උපලේඛනයන්හි අඩුපාඩු සම්පූර්ණ කර 2020 අවසන් ගිණුම මගින් ඉදිරිපත් කරන බව දන්වමි. |

1.4 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම්

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | 51,136.549 | ඉඩම් ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කිරීමකට ලක් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි පිලිබඳව සමීක්ෂණයක් සිදු කරමින් පවති. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 (1)(2) | 1,774,720 | ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | කල් ඉකුත් වූ සියළු තැන්පත් ආදායමට ගැනීමට කටයුතු කරමින් පවති. |
| (ඇ) | 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන ගැසට් නිවේදනය | - | සමීක්ෂණයක් මගින් පරිසර බලපත්‍ර ලබාගත යුතු ආයතන හඳුනාගෙන නොතිබුණි. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මේ සඳහා යොදවා ගැනීමට අදාල නිලධාරින් නොමැති අතර ඉදිරියේදී ආදායම් පරික්ෂක තනතුර සම්පූර්ණ විමෙන් අනතුරුව පූර්ණ සමීක්ෂණයක් සිදු කරන බව දන්වමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.9,040,598 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,716,475 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,648,580 | 2,745,710 | 2,301,336 | 444,374 | 2,785,796 | 2,171,699 | 3,039,076 | 1,799,048 |
| (ii) | කුලී | 7,762,754 | 7,179,431 | 7,179,431 | - | 262,800 | 262,800 | 262,800 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 280,000 | 384,507 | 384,507 | - | 90,000 | 320,679 | 320,679 | - |
| (iv) | වෙනත් ආදායම් | 56,027,370 | - | 5,547,593 | - | 63,513,839 | - | 67,872,012 | - |
| | | 66,718,704 | 10,309,648 | 15,412,867 | 444,374 | 66,652,435 | 2,755,178 | 71,494,567 | 1,799,048 |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

--------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.65,849 ක් වූ අක්කර බදු හිඟයෙන් රු.6,499 ක් පමණක් වර්ෂය තුල අයකර ගෙන තිබුණි. | හිඟ ආදායම් අයකර ගත යුතුය. | ඉඩම් වල හිමිකරුවන්ගේ ලිපිනයන් සොයා ගැනීමට නොමැති වීම නිසා අයකර ගැනීම දුෂ්කර වී ඇත. ඉතා ඉක්මනින් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

2.2.3 මස්කඩ කුලී

--------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2012 වර්ෂයේ සිට පැවත එන රු.56,637 ක් වූ හිඟ මස් කඩ කුලී ආදායමක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගත යුතුය. | පරීක්ෂණයක් පවත්වා ඒ අනුව කටයුතු කරමින් පවතින බව දන්වමි. |

2.2.4 මුද්දර ගාස්තු

----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.1,391,990 ක් විය. | හිඟ ආදායම් අයකර ගත යුතුය. | 2019 වර්ෂයේ මුද්දර ගාස්තු උපලේඛන සකස් කරමින් පවතින බව දන්වමි. |

3 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්ය සාධනය

------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගී සේවා, සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය , පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) අතුරු ව්‍යවස්ථා<br>------------------<br>ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 16 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් සභාව විසින් ප්‍රධාන කාරණා 08 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණි. | ප්‍රාදේශිය සභා පනත අනුව අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුය. | සභාවේ අවශ්‍යතාවය මත අතුරු ව්‍යවස්ථා 08 ක් පනවා ගෙන ඇති අතර අවශ්‍යතාවය අනුව වෙනත් අතුරු ව්‍යවස්ථා පනවා ගැනිමට කටයුතු කරන බව දන්වමි. |

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

---------------------

(i) ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීමේ අඩුපාඩු

-----------------------------------------------

| | | |
|---|---|---|
| ක්‍රියාකාරි සැලැස්ම තුල ව්‍යාපෘති වෙනුවෙන් පිරිවැය වෙන් වෙන්ව හඳුනාගෙන කාල රාමුවකට අනුව ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීම පිළිබඳව විධිමත් ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබුණි. | නිවැරදිව ක්‍රියාකාරි සැලැස්ම සකස් කළ යුතුය. | පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර 2021 ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරිමේ කටයුතු කරන බව දන්වමි. |

(ii) ක්‍රියාකාරි සැලැස්මේ ව්‍යාපෘති ඉටු නොකිරිම හා පරිභාහිර ව්‍යාපෘති ඉටු කිරීම

-----------------------------------------------------

| | | |
|---|---|---|
| ක්‍රියාකාරි සැලැස්ම තුල ව්‍යාපෘති 17 ක් හඳුනාගෙන තිබුණද එම ව්‍යාපාති වලින් 2019 වර්ෂය තුල කිසිදු ව්‍යාපෘතියක් සිදු කර නොතිබු අතර ක්‍රියාකාරි සැලැස්මෙන් පරිභාහිර ව්‍යාපෘති 03 ක් සඳහා රු.394,108 ක් වැය කර තිබුණි. | ක්‍රියාකාරි සැලැස්මට අනුව කටයුතු කල යුතුය. පරිභාහිර ව්‍යාපෘතින් වෙනුවෙන් අදාල අනුමැතීන් ලබා ගත යුතුය. | මුල්‍යා තත්ත්වය යහපත් වු විගස සැලසුම් කර ඇති ව්‍යාපෘති අවසන් කිරිමට කටයුතු කරන බව දන්වමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

| | | |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධව 2019 වර්ෂයට තිරසර සංවර්ධන සැලැස්මක් සකස් කර ක්‍රියාකාරකම් 11 ක් සැලසුම් කර තිබුණ ද ඉන් කිසිඳු ක්‍රියාකාරකමක් ඉටු කර නොතිබුණි. | අදාල චක්‍රලේඛ හා මඟ පෙන්වීම් වලට අනුව කටයුතු කල යුතුය. | තිරසර සංවර්ධන වැඩ සටහන් සැලසුම් කර තිබුණ ද, ක්‍රියාත්මක කිරීම සඳහා මුල්‍යා තත්ත්වය ප්‍රමාණවත් නොවීය. ඉදිරියේදී ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------ | ---------------------- |
| ආයතන 12 කට අදාලව කල් ඉකුත් වි තිබු පරිසර බලපත්‍ර නැවත අළුත් කිරිමට කටයුතු කර නොතිබුණි. | පරිසර බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත්ව සිදු කළ යුතුය. | පරිසර බලපත්‍ර ලබා නොගෙන ඇති ව්‍යාපාර හිමියන් දැනුවත් කර ඇති අතර ඔවුන් ඉදිරිපත් නොවීම හේතුවෙන් අදාල බලපත්‍ර ලබා දී නොමැති බව දන්වමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත | | |
| 2019 දෙසැම්බර් 31 දිනට තෘතියික මට්ටමේ තනතුරු 01 ක, ද්විතියික මට්ටමේ තනතුරු 11 ක හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 10 ක පුරප්පාඩු පැවති අතර ද්විතියික මට්ටමේ තනතුරු 02 ක අතිරික්තයක් නිරික්ෂණය විය. | අත්‍යවශ්‍ය පුරප්පාඩු කඩිනමින් පුරවා ගැනීමට කටයුතු කළ යුතු අතර අතිරික්ත තනතුරු සඳහා අනුමැතීන් ලබාගත යුතුය. | ප්‍රාථමික මට්ටමේ තනතුරු සඳහා බඳවා ගැනීම කළමනාකරණ චක්‍ර ලේඛ 01/2020 මගින් නොහැකි වී ඇත. අනෙක් තනතුරු දෙපාර්තමේන්තු මට්ටමින් බඳවා ගත යුතු බව දන්වමි. |
| (ආ) සේවක ණය | | |
| මියගිය , විශ්‍රාම ගිය , සේවය හැර ගිය හා ස්ථාන මාරු වී ගිය සේවකයින් 12 දෙනෙකුගෙන් අයවිය යුතු රු.272,925 ක ණය ශේෂය අයකර ගෙන නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගත යුතුය. | හිඟ ණය මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |

4. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ වාර්තාවේ 2.2.1( අ) හා (ඉ) ඡේද වලට අදාල නිරීක්ෂණ නිවැරදි කිරිමට කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමේ ක්‍රියා මාර්ග ගත යුතුය. | 2020 අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |